// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1656/23 - 2010 ජුනි 01 වැනි අඟහරුවාදා - 2010.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

පාවිච්චි කරන ලද මෝටර් වාහන සඳහා අඩුකළ වටිනාකම (මිල) ගණනය කිරීම

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ "ඊ" උපලේඛනයේ අංක 10 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු මුදල් ඇමතිතුමා විසින් නිකුත් කරන ලද නියෝගය සඳහන් වන 2003 ජනවාරි 31 දිනැති අංක 1273/21 දරන *රජයේ ගැසට් නිවේදනය* පරිදි, මෙහි පහත සඳහන් වගුවේ ප්‍රකාර සංයෝජිත වර්ගීකරණ සංකේත යටතේ වර්ගීකරණය වන පාවිච්චි කළ මෝටර් වාහන සඳහා වටිනාකම (මිල) නියම කිරීම වර්ෂ 2010 ජුනි මස 01 වැනි දින සිට බලපවත්වන පරිදි සිදු කරන බව මහජනතාව වෙත මෙයින් දන්වනු ලැබේ.

අඩුකළ වටිනාකම (මිල) ගණනය කිරීම සම්බන්ධයෙන් වර්ෂ 2004 ඔක්තෝබර් මස 14 වැනි දින පළ කරන ලද අංක 1362/15 දරන *ගැසට් නිවේදනය* මෙයින් අවලංගු කරමි.

අදාළ වාහනයේ ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනය හා නැව්ගත කළ දිනය (නැව් භාර පත්‍රයේ දිනය) අතර කාලය, වාහනය පාවිච්චි කරන ලද කාලය වශයෙන් සලකනු ලැබේ.

අදාළ වාහනය ප්‍රථම ලියාපදිංචි කිරීමේ දී මාසය හා වර්ෂය පමණක් සඳහන් කර ඇති අවස්ථාවක, අදාළ මාසයේ අවසාන දිනය වාහනයේ ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනය ලෙස සලකනු ලැබේ.

අදාළ වාහනය ප්‍රථම ලියාපදිංචි කිරීමේ දී වර්ෂය පමණක් සඳහන් කර ඇති අවස්ථාවක, එම වර්ෂයේ ජූලි 01 වැනි දින එහි ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනය ලෙස සලකනු ලැබේ.

1A - G 12499 — 980 (2010/06)

### පාවිච්චි කරන ලද මෝටර් වාහන සඳහා අඩුකළ වටිනාකම (මිල) ගණනය කිරීමේ වගුව

| *පාවිච්චි කරන ලද කාල පරිච්ඡේදය* | *අඩුකළ FOB (නැව තෙක් නොමිලේ) වටිනාකම* | |
|---|---|---|
| | *වර්ගීකරණ අංක 87.03 මෝටර් කාර් සහ මෝටර් වාහන* | *වර්ගීකරණ අංක 87.01, 87.02, 87.04 සහ 87.11 මෝටර් වාහන* |
| මාස 06 ක් හෝ එයට අඩු | නැත | නැත |
| මාස 06 කට වැඩි සහ අවුරුද්දක් දක්වා | 90% | 90% |
| අවුරුද්දකට වැඩි සහ අවුරුදු 1 1/2 දක්වා | 80% | 80% |
| අවුරුදු 1 1/2 ට වැඩි සහ අවුරුදු 2 දක්වා | 80% | 70% |
| අවුරුදු 2 ට වැඩි සහ අවුරුදු 2 1/2 දක්වා | 75% | 65% |
| අවුරුදු 2 1/2 ට වැඩි සහ අවුරුදු 3 දක්වා | 75% | 60% |
| අවුරුදු 3 ට වැඩි සහ අවුරුදු 3 1/2 දක්වා | 70% | 55% |
| අවුරුදු 3 1/2 ට වැඩි සහ අවුරුදු 4 දක්වා | 60% | 50% |
| අවුරුදු 4 ට වැඩි සහ අවුරුදු 4 1/2 දක්වා | 55% | 50% |
| අවුරුදු 4 1/2 ට වැඩි සහ අවුරුදු 5 දක්වා | 50% | 50% |
| අවුරුදු 5 ට වැඩි සහ අවුරුදු 5 1/2 දක්වා | 40% | 35% |
| අවුරුදු 5 1/2 ට වැඩි සහ අවුරුදු 6 දක්වා | 40% | 30% |
| අවුරුදු 6 ට වැඩි සහ අවුරුදු 6 1/2 දක්වා | 40% | 25% |
| අවුරුදු 6 1/2 ට වැඩි සහ අවුරුදු 7 දක්වා | 40% | 25% |
| අවුරුදු 7 ට වැඩි | 40% | 25% |

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය).

2010 ක් වූ ජුනි මස 01 වැනි දින,
කොළඹ 1,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

06-340

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.